# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2270/68 – 2022 මාර්තු 11 වැනි සිකුරාදා – 2022.03.11**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/04/2018/194.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරිය**

131 වන අධිකාරිය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2019.11.09 දිනැති හා අංක 2148/58 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2019.11.04 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් මුල්ලේරියාව නවනගරය, කැලණිමුල්ල, අංක 410/17 පදිංචි ආර්. මැණික්ගමආරච්චි මයා, පිලියන්දල, සිද්ධමුල්ල අංක 21/7 හි පදිංචි එම්. කේ. ඩී. මනෝජ් ගුණරුවන් මයා සහ රත්මලාන, ගාලුපාර පිහිටි ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමුකරන ලදුව බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2021.12.20 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත්කරනු ලැබේ.

බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2022 පෙබරවාරි මස 29 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

බේරුම්කරණයේ දී ය

1. ආර්. මැණික්ගමආරච්චි මයා, අංක 410/17. කැලණිමුල්ල, මුල්ලේරියාව නවනගරය.

2. එම්. කේ. ඩී. මනෝජ් ගුණරුවන් මයා, අංක 21/7, සිද්ධමුල්ල, පිළියන්දල.

නඩු අංක A / 122/2019

සහ

ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය, ගාලුපාර, රත්මලාන.

අතර

**ප්‍රදානය**

කම්කරු හා වෘත්තීය සබඳතා අමාත්‍යවරයා විසින් වර්ෂ 1957 අංක 14 සහ 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන පනත සමග කියවෙන) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව, ඉහත කී පළවන හා දෙවන ඉල්ලුම්කාර පාර්ශවයන් හා දෙවන වගඋත්තරකාර පාර්ශවය අතර පවත්නා ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් 2019.11.04 දිනැති නියෝගයෙන් මා පත්කර මා වෙත යොමු කර ඇත.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති කාර්මික ආරවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ

''ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලයේ සේවය කරන ආර්. මැණික්ගමආරච්චි සහ එම්. කේ. ඩී. මනෝජ් ගුණරුවන් යන අය හට 2015.05.21 ක් වන දින සිට ක්‍රියත්මක වන පරිදි කළමණාකරු (මානව සම්පත්) තනතුරට ලබාදුන් උසස්වීම 2016.09.07 දින සිට ක්‍රියාත්මක වන පරිදි අවලංගු කිරීමෙන් එම සේවකයින් දෙදෙනාට අසාධාරණයක් සිදුව තිබේ ද? අසාධාරණයක් සිදුවී ඇත්නම් හිමිවිය යුතු සහන කවරේ ද?'' යන්න පිළිබඳව වේ.

නඩු විභාගය ආරම්භ කිරීමේදී ඉල්ලුම්කාර පාර්ශ්වයේ පළමු පාර්ශවය පැමිණි අතර ඔහු වෙනුවෙන් පෙනී සිටීමක් නොවීය. ඉල්ලුම්කාර පාර්ශවයේ දෙවන පාර්ශවය පැමිණ සිටි අතර ඔහු වෙනුවෙන් නීතිඥ මහේන්ද්‍ර ඩයස් මහතා පෙනී සිටින ලදී. දෙවන වගඋත්තරකාර පාර්ශවය වන ආයතනය වෙනුවෙන් නීති නිලධාරී ඒ. ආර්. දහනායක මහතා හා රජයේ නීතිඥ ගංගානි උක්වත්ත මහත්මිය පෙනී සිටින ලදී.

අඩක් විභාග කරන ලද මෙම නඩුව 2021.12.20 වැනි දින කැඳවූ අවස්ථාවේ පළමුවන පාර්ශ්වයේ ඉල්ලුම්කරුවන් දෙදෙනාම පැමිණ නොසිටි අතර, පළමුවන පාර්ශවයේ පළමුවන ඉල්ලුම්කරු අවසන් වරට කැඳවූ 2021.03.30 වන දිනද පැමිණ නොසිටින ලදී. ඔහු වෙනුවෙන් පෙනීසිටීමක්ද එදින නොවීය. එදින නොපැමිණීම මත ඉල්ලීම නිෂ්ප්‍රභා කරන ලෙසට දෙවන පාර්ශ්වය වෙනුවෙන් ඉල්ලීමක් කළ ද අවසන් වශයෙන් දිනයක් නියම කර ඇති අතර, අද දිනද ඉල්ලුම්කාර පාර්ශවයේ එකී පළමුවන පාර්ශවය පැමිණ නැත. එමෙන්ම පැමිණිලිකාර පාර්ශවයේ දෙවන ඉල්ලුම්කරු වෙනුවෙන් 2021.12.15 දිනැති ලිපියක් ගොනුකරමින් තමා තවදුරටත් මෙම නඩුව පවත්වාගෙන නොයන බවට දන්වා ඇත. අද දිනට පැමිණිකාර පාර්ශවයේ ඉල්ලුම්කරුවන් දෙදෙනා පැමිණ නොමැතිවීම පෙනී සිටීමක් නොවීම මත මෙම ඉල්ලීම නිෂ්ප්‍රභා කරන ලෙසට පළමු වගඋත්තරකාර පාර්ශවය වෙනුවෙන් ඉල්ලාසිටී. ඒ අනුව පළමු හා දෙවන ඉල්ලුම්කරුවන් මෙම ඉල්ලීම වැඩිදුරටත් පවත්වාගෙන යාම සම්බන්ධයෙන් උනන්දුවක් නෙදක්වන බව පෙනී යන හෙයින් දෙවන පාර්ශවය වෙනුවෙන් කරනු ලබන ඉල්ලීමට ඉඩදෙමින් මෙම ඉල්ලුම්පත්‍රය නිෂ්ප්‍රභා කරමින් නියෝගය නිකුත් කරමි.

කේ. ඒ. පියරත්න,
බේරුම්කරු.

2021 දෙසැම්බර් මස 20 වැනි දින,
කොළඹ දී ය.
EOG 03 -0845

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.